# සිල්වතා මෙලොව පරලොව සතුටු වෙයි දුසිල්වතා මෙලොව පරලොව දුක් විඳියි

## සීලව ස්ථවිර ගාථා ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, ථෙරථෙරීගාථාපාළි, ථෙරගාථා, ද්වාදසනිපාතය - පිටු අංක 166 - 167)

- සීලයෙන් නොහික්මුණු තැනැත්තා මේලොව ද නින්දා ලබයි. පරලොව ද නොසතුටු සිත් ඇත්තෙක් ව වෙසෙයි. සෑම තැන්හි ම දොම්නස් සිතැත්තේ වෙයි.
- සිල්වත් වූ හික්මුණු තැනැත්තා මේ ලෝකයේ දී ම කීර්තිය ලබයි. පරලොවෙහි ස්වර්ග සැපයෙන් සතුටු වෙයි. සෑම තැන්හි ම සතුටු සිතැත්තේ වෙයි.
- මේ ශාසනයෙහි සීලය ම අග්‍රය. ප්‍රඥාවන්තයා උතුම් වෙයි. මිනිසුන් සහ දෙවියන් අතුරෙහි ශීල ප්‍රඥා දෙකෙන් ජය ලැබෙයි.